[...ලු ම හිමිකම් ඇවිරිණි]
[...ப் பதிப்புரிமையுடையது]
[... Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

5

EXAMINATION FOR GRADE FIVE STUDENTS FOR SELECTION TO SCHOOLS AND FOR THE AWARD OF BURSARIES, AUGUST 2010

# පාසල්වලට සිසුන් තෝරා ගැනීමට සහ ශිෂ්‍යාධාර ප්‍රදානය කිරීමට පස්වන ශ්‍රේණියේ සිසුන් සඳහා පැවැත්වෙන විභාගය, 2010 අගෝස්තු

## I පත්‍රය

මිනිත්තු 45 යි.

විභාග අංකය ..........................................

...ගයට පෙනී සිටින ඔබට උපදෙස්:

- ඔබේ **විභාග අංකය** ඉහත කොටුව තුළ ඇති තිත් ඉර මත ලියන්න.
- **තුන්වැනි පිටුවේ** ඇති නියමිත ස්ථානයේ ද ඔබේ **විභාග අංකය** ලියන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න **40** ක් ඇත. **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම** සපයන්න.
- සෑම ප්‍රශ්නයකට ම පිළිතුරු තුන බැගින් දී ඇත. ඒවා අතරෙන්, එක් එක් ප්‍රශ්නයට අදාළ **නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**
- කටුවැඩ කිරීම සඳහා කඩදාසියක් සපයනු ලැබේ.

...ත්තර පත්‍ර පරීක්ෂකවරුන් සඳහා පමණි.

| පිටු අංකය | ලැබූ ලකුණු |
|---|---|
| 02 | |
| 03 | |
| 04 | |
| 05 | |
| 06 | |
| 07 | |
| 08 | |
| එකතුව | |

අවසාන ලකුණ

| | |
|---|---|
| ඉලක්කමෙන් | |
| අකුරෙන් | |


| | අත්සන | සංකේත අංකය |
|---|---|---|
| පළමුවන පරීක්ෂක | | |
| දෙවන පරීක්ෂක | | |
| ගණිත පරීක්ෂක | | |
| ප්‍රධාන පරීක්ෂක | | |

[2 වැනි පිටුව බලන්න

※ එක් එක් ● යටතේ දී ඇති උපදෙස් අනුව ඊට පහළින් ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න

● මුලින් ඇති රූපයට සමාන රූපය තෝරන්න.

1.






(1)



(2)


(3)

2.




(1)


(2)


(3)

● එක් කාණ්ඩයකට අයත් දේවල් ඇතුළත් කොටුව තෝරන්න.


3.



(1)



(2)


(3)

4.


(1)


(2)


(3)

● අන්තර් සම්බන්ධතාවක් දැකිය **නොහැකි** වචන ඇතුළත් කොටුව තෝරන්න.

5.

| (1) | (2) | (3) |
|---|---|---|
| වෛද්‍යවරයා<br>හෙදිය<br>රෝගියා | විදුහල්පතිවරයා<br>ගුරුවරයා<br>ශිෂ්‍යයා | ධීවරයා<br>මහ මුහුද<br>වෙළෙඳපොළ |

6.

| (1) | (2) | (3) |
|---|---|---|
| කරුණාව<br>සෙනෙහස<br>ආදරය | බිය<br>සතුට<br>හැඟීම | උනන්දුව<br>උත්සාහය<br>ජයග්‍රහණය |

[3 වැනි පිටුව බලන්න

- දී ඇති කවිය ඇසුරෙන් පිළිතුරු සපයන්න.

වත්ත පුරා හිමිදිරියේ - සුදු පාටට මල් පිපිලා
මද සුළඟේ නැළවෙන කොට - හරිම ලස්සනයි
සුදු පාටින් බැබළි බැබළි - අකුරට යන පුංචි පැටව්
නැළවෙන මල්වලට වඩා - හරිම පියකරුයි

7. මෙම කවියෙන් කියැවෙන්නේ
   (1) වත්ත පුරා පිපී ඇති මල් ගැන ය.
   (2) පුංචි ළමයින්ගේ පියකරු බව ගැන ය.
   (3) සුළඟට මල් සෙලවෙන ආකාරය ගැන ය.


8. මෙම කවියේ 'අකුරට යන' යෙදුමෙහි අදහස කුමක් ද?
   (1) ඉගෙනීමට යන
   (2) පුස්තකාලයට යන
   (3) පේළියට යන

- නිවැරදි පිළිතුර තෝරන්න.

9. 'දිය මතුපිට ඇඳි ඉරක් වගේ' යන යෙදුමෙන් අදහස් වන්නේ
   (1) යමක් ඉතා ඉක්මනින් අමතක වී යාම ය.
   (2) ඉටු කළ නොහැකි දෙයක් සඳහා වෙහෙසීම ය.
   (3) යන්තම් ගැලවීමට වැඩ කිරීම ය.

10. 'කාගේත් හොඳ නරක පෙනෙන්නේ වැඩක් කරන විටදී ය.' යන්නට ගැළපෙන යෙදුම කුමක් ද?
   (1) ආචාරියා රවටා කැත්ත හැදුවා වගේ ය.
   (2) කණ කොක් සුද පෙනෙන්නේ ඉගිළෙන විට ය.
   (3) මටිකිරි විසිකර දියකිරි ගත්තා වගේ ය.

11. ලිපියක් ලියා තැපැල් කිරීමට අදාළ ක්‍රියාකාරකම් කිහිපයක් රූපවලින් දක්වේ. එම ක්‍රියාකාරකම් සිදුවීමේ අනුපිළිවෙළ අනුව රූප පෙළ ගැස්විය යුතු ආකාරය දක්වෙන පිළිතුර තෝරන්න.




(1) A B D C E F  (2) A B C D E F  (3) A C B E D F

[4 වැනි පිටුව බලන්න

12. මෙම සංවාදය කියවා බලන්න. එහි පියවර නිවැරදි අනුපිළිවෙළින් දක්වෙන පිළිතුර තෝරන්න.

A - හා! හරි ලස්සන ගවුමක්.

B - අනේ මචී. මං හරි ආසයි.

C - ඇත්තද! මේක අලුත් එකක් නෙවෙයි.


D - ඔයා මේකට කැමති ද?

E - ඒ වුණාට හරි ලස්සනයි.

(1) A C E D B (2) A D B C E (3) A B D E C


- සංඛ්‍යා යොදා ඇති රටා හඳුනාගෙන, හිස්තැනට ගැළපෙන පිළිතුර තෝරන්න.

13.




(1) 8 (2) 4 (3) 12


14.





(1) 1 (2) 2 (3) 5

- රටාව හඳුනාගෙන ඊළඟට ආයුතු රූපය තෝරන්න.


15.






(1) (2) (3)

16.



(1) (2) (3)

[5 වැනි පිටුව බලන්න

- එක් එක් ගැටලුවට නිවැරදි පිළිතුර තෝරන්න.


17. 1 රූපයෙහි දැක්වෙන වෘත්තාකාර කඩදාසිය 2 රූපයෙහි දැක්වෙන පරිදි හතරට නමා, 3 රූපයෙහි දැක්වෙන පාට කළ කොටස කපා ඉවත් කර, ඉතිරි කොටස දිගහැරිය විට ලැබෙන හැඩය කුමක් ද?







18. රූපයේ දැක්වෙන හැඩයේ පිරමිඩයක ඉහළ කොටසෙන් එම හැඩයම ඇති කුඩා පිරමිඩයක් කපා ඉවත් කළ විට ඉතිරිවන කොටසේ ඇති මුහුණත් ගණන කීය ද?



(1) 6 (2) 5 (3) 4

19. සඳුදාට වඩා රුපියල් 10 ක් අඩුවෙන් අඟහරුවාදා ද අඟහරුවාදාට වඩා රුපියල් 5 ක් අඩුවෙන් බදාදා ද නිමල් වියදම් කළේ ය. ඔහු අඟහරුවාදා වියදම් කළේ රුපියල් 30 ක් නම්, දින තුනේදී ම වියදම් කළ මුළු මුදල

(1) රුපියල් 75 කි. (2) රුපියල් 90 කි. (3) රුපියල් 95 කි.

20. ලණුවක් සමාන කොටස් දෙකකට කපා, ඉන් එක් කොටසක් තවත් සමාන කැබලි හතරකට වෙන් කර කපන ලදී. එම එක් කැබැල්ලක දිග මීටර 1 නම්, මුලින් තිබූ ලණුවේ දිග

(1) මීටර 8 යි.
(2) මීටර 5 යි.
(3) මීටර 4 යි.

- කොටු තුළ ඉලක්කම් යොදා ඇත්තේ කිසියම් රටාවකට ය. ඒ අනුව,


| | | | | | |
|---|---|---|---|---|---|
| | | 3 | 4 | | A |
| 1 | 2 | | 5 | 8 | |
| 6 | | | | | 12 |
| 7 | | 9 | 10 | | B |

21. A අකුර ලියා ඇති කොටුවට ගැළපෙන ඉලක්කම කුමක් ද?
(1) 9
(2) 10
(3) 11

22. B අකුර ලියා ඇති කොටුවට ගැළපෙන ඉලක්කම කුමක් ද?
(1) 12
(2) 11
(3) 1

[6 වැනි පිටුව බලන්න

- දී ඇති රූපයේ, සංගීතයට කැමැති ළමයින් සෘජුකෝණාස්‍රයෙන් ද චිත්‍රවලට කැමැති ළමයින් ත්‍රිකෝණයෙන් ද නැටුම්වලට කැමැති ළමයින් සමචතුරස්‍රයෙන් ද දැක් වේ.




23. චිත්‍ර, නැටුම් හා සංගීතය යන **තුනට ම** කැමැති ළමයා කවුද?
    (1) නිමල් (2) සරත් (3) උදය

24. සංගීතය සහ චිත්‍ර යන **දෙකට පමණක්** කැමැති ළමයි කවුරුද?
    (1) විජය සහ කමලා (2) අමරා සහ සුදත් (3) කමලා, අමරා සහ සුදත්


- වචන සඳහා ඉංග්‍රීසි අකුරු යොදා ඇති ආකාරය අනුව, නිවැරදි වාක්‍යය සෑදෙන සේ ඒවායේ ගැළපීම තෝරන්න.

25. A - බෑගය ද රැගෙන B - හැඳ පැළඳ C - නංගා
    D - ගමන පිටත්විය. E - බයිසිකලයක නැගී
    (1) A B C E D (2) C B A E D (3) C B D A E


26. A - අක්කා B - මල්ලීට C - නංගීට
    D - ගවුමක් ද E - කමිසයක් ද F - මිලදී ගත්තාය.
    (1) A B D C E F (2) A B E D C F (3) A B E C D F

- රූප බලා නිවැරදි පිළිතුර තෝරන්න.

27. අඳුරු කර ඇති කොටස මුළු රූපයෙන්,
    (1) $\frac{1}{4}$ ට වඩා අඩු ය.
    (2) $\frac{1}{4}$ ට සමාන ය.
    (3) $\frac{1}{4}$ ට වඩා වැඩි ය.



28. මුළු රූපයේ වර්ගඵලය, අඳුරු කර ඇති කොටසේ වර්ගඵලය මෙන්,
    (1) දෙගුණයකි.
    (2) තුන්ගුණයකි.
    (3) හතරගුණයකි.



[7 වැනි පිටුව බලන්න

- රු. 453.18 යන්න R. CFD.BG ලෙස සංකේත මගින් දැක්විය හැකි නම්.

29. රු. 1853.34 දැක්විය හැක්කේ කෙසේ ද?
(1) R. AHEC.CD (2) R. BGFD.DC (3) R. BGFD.BG

30. R. ABCD.EF මගින් දැක්විය හැක්කේ කුමක් ද?
(1) රු. 1234.56 (2) රු. 2134.65 (3) රු. 2143.65

- දී ඇති වාක්‍ය අතරෙන් වඩාත් නිවැරදි අර්ථය සහිත වාක්‍යය තෝරන්න.

31. (1) කැලය මත කාක්කා සිටියේ ගසක කඳ දෙසට මුහුණලා ය.
(2) ගසක කඳ මත කාක්කා සිටියේ කැලය දෙසට මුහුණලා ය.
(3) කාක්කා මත ගසක කඳ සිටියේ කැලය දෙසට මුහුණලා ය.

32. (1) දෙගුරුන් හමුවේ තම වරද නො සඟවා ගුරුවරුන් හා පැවසිය යුතු ය.
(2) ගුරුවරුන් තම වරද හමුවේ නො සඟවා දෙගුරුන් හා පැවසිය යුතු ය.
(3) ගුරුවරුන් හා දෙගුරුන් හමුවේ තම වරද නො සඟවා පැවසිය යුතු ය.

- එක් එක් ගැටලුවට නිවැරදි පිළිතුර තෝරන්න.

33. සමාන පරිමා අඩංගු කිරි වීදුරුවක් සහ වතුර වීදුරුවක් ගෙන, කිරි වීදුරුවෙන් මිලිලීටර 10 ක් වතුර වීදුරුවට දමා මිශ්‍ර කර, එම මිශ්‍රණයෙන් මිලිලීටර 10 ක් නැවත කිරි වීදුරුවට දමන ලදි. දන් වීදුරුවේ, කිබු
(1) කිරිවල වෙනසක් සිදු වී නැත.
(2) ජලයෙහි වෙනසක් සිදු වී නැත.
(3) කිරිවල වෙනසක් සිදු වී ඇත.

34. කොටස් දෙකම සමාන වන පේළිය තෝරන්න.
(1) 3 4 4 6 7 5 8 – 3 4 4 7 6 5 8
(2) N M W A Y – M N W A Y
(3) 3 Y ᗺ 2 Я R – 3 Y ᗺ 2 Я R

35. දුර දිවීමේ තරගයකදී ළමයින් 5 දෙනකු තරගය නිමකළ ආකාරය මෙසේ ය.
කුමාර - මිනිත්තු 5
උදය - මිනිත්තු 8
ප්‍රියන්ත- තරගය නිම කළේ නැත.
සුදත් - මිනිත්තු 4
විජය - මිනිත්තු 6
ඔවුන් ජය කණුව කරා ළඟා වූ අනුපිළිවෙළ කුමක් ද?
(1) සුදත්, කුමාර, විජය, උදය
(2) උදය, විජය, කුමාර, සුදත්
(3) සුදත්, ප්‍රියන්ත, කුමාර, උදය

[8 වැනි පිටුව බලන්න


36. වාහනයක් පෙට්‍රල් ලීටරයකින් කිලෝමීටර 10 ක් ගමන් කරයි. පෙට්‍රල් ලීටර 10 ක් පුරවා
ගමන් ආරම්භ කළ වාහනයක් කිලෝමීටර 60 ක් ගමන් කළේ ය. ඉතිරි පෙට්‍රල්වලින් වාහන
කිලෝමීටර කීයක් ගමන් කළ හැකි ද?


(1) 60 (2) 40 (3) 30

37. නගරයක්, අදියර දෙකකින් සංවර්ධනය කිරීමට සැලසුම් කොට තිබුණි. පළමුවන අදියර සඳහා
10 ක් ද දෙවන අදියර සඳහා මාස 15 ක් ද ගත වේ. නගරයේ සංවර්ධන කටයුතු 2010 ජන
මස ආරම්භ කෙරුණි නම්, නගරය සංවර්ධනය කොට අවසන් කළ හැක්කේ කුමන වර්ෂයේ ?


(1) 2014 (2) 2013 (3) 2012

38. මුලින් දී ඇති රූපයේ හැඩයට සමාන හැඩයක් ඇති රූපය තෝරන්න.






(1)



(2)



(3)

- එක් එක් රටාවේ ඊළඟට යෙදිය යුතු රූපය තෝරන්න.

39.  ............




(1)



(2)




(3)

40. 


............




(1)




(2)




(3)

* * *

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**5**

EXAMINATION FOR GRADE FIVE STUDENTS FOR SELECTION TO SCHOOLS AND FOR THE AWARD OF BURSARIES, AUGUST 2010

**පාසල්වලට සිසුන් තෝරා ගැනීම සහ ශිෂ්‍යත්වාධාර ප්‍රදානය කිරීමට පස්වන ශ්‍රේණියේ සිසුන් සඳහා පැවැත්වෙන විභාගය, 2010 අගෝස්තු**

# II පත්‍රය

පැය 1 මිනිත්තු 15 යි.

විභාග අංකය :

## විභාගයට පෙනී සිටින ඔබ සඳහා උපදෙස්

- ඔබේ **විභාග අංකය** ඉහත කොටුව තුළ ඇති **තිත් ඉර මත** ද, **තුන්වැනි පිටුවේ** ඇති නියමිත ස්ථානයේ ද ලියන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න **54** ක් ඇත. (සමහර ප්‍රශ්නවල අනුකොටස් ඇත.) **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම** සපයන්න.
- පිළිතුරු හතරක් දී ඇති ප්‍රශ්නවල **නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**
- පිළිතුරු ලියන්නට ඇති ප්‍රශ්නවල පිළිතුරු **තිත් ඉර මත** ලියන්න.
- කටුවැඩ කිරීම සඳහා කඩදාසියක් සපයනු ලැබේ.

### උත්තර පත්‍ර පරීක්ෂකවරුන් සඳහා පමණි.

| පිටු අංකය | ලැබූ ලකුණු |
|---|---|
| 02 | |
| 03 | |
| 04 | |
| 05 | |
| 06 | |
| 07 | |
| 08 | |
| එකතුව | |

අවසාන ලකුණ

| | |
|---|---|
| ඉලක්කමෙන් | |
| අකුරෙන් | |

| | අත්සන | සංකේත අංකය |
|---|---|---|
| උත්තර පත්‍ර පරීක්ෂක | | |
| ලකුණු පරීක්ෂක | | |
| ගණිත පරීක්ෂක | | |
| අධීක්ෂක | | |

[ 3 වැනි පිටුව බලන්න.

1. පහත දැක්වෙන කවි දෙක කියවන්න.

සිසි විටක අලස ව නැතී
මුළු දවස නිති වෙහෙසෙතී
නරන් මෙන් ගැටුමක් නැතී
එකා මෙන් සැම වැජඹෙතී

එක එකා ගොස් එක වගේ
රැස් කරන පැණි කුඩු අගේ
එකතු වෙන සැටි හරි අගේ
එතැන රජ දහනක් වගේ

ඉහත කවි දෙක ඇසුරෙන්, **(i)** සිට **(vi)** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i) මෙම කවි දෙකෙන් කියැවෙන්නේ කවර **සතුන්** ගැන ද? ........................

(ii) මෙහි සඳහන් වන, **'මිනිසුන්'** යන අර්ථය දෙන **නාමපදය** ලියන්න.

........................

(iii) **'කම්මැලි'** යන පදයට අර්ථයෙන් **සමාන** පදය තෝරා ලියන්න. ........................

(iv) **'ඉඳහිට'** යන පදයට අර්ථයෙන් **විරුද්ධ** පදය තෝරා ලියන්න. ........................

(v) මෙහි සඳහන් **උපමාවක්** තෝරා ලියන්න.

........................................................

(vi) තේරුම් දෙකක් දීම සඳහා **'අගේ'** යන පදය යෙදී ඇත. එම **තේරුම් දෙක** පිළිවෙළින් ලිය

(අ) ........................................................

(ආ) ........................................................

2. පහත සඳහන් එක් එක් වාක්‍යය, නිවැරදි නම් ✔ ලකුණ ද, වැරදි නම් ✕ ලකුණ ද, එම වා
ඉදිරියේ ඇති **තිත් ඉර මත** යොදන්න.

(i) පනාමුරේ කුංච නාද රැව් පිළිරැව් දෙයි. ..........

(ii) ඇතැමෙක් පොත් කියවීමෙන් විනෝදයක් ලබයි. ..........

(iii) ගුරුතුමිය පමා නොවී පංතියට පැමිණියේ ය. ..........

(iv) රාත්‍රී අහසේ තරු බබළයි. ..........

3. නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත වචනය තෝරා **යටින් ඉරක් අඳින්න.**

(i) (1) ආකර්ශණ (2) ආකර්ෂන (3) ආකර්ෂණ (4) ආකර්සන

(ii) (1) ළතැවිල්ළ (2) ලතැවිල්ල (3) ළතැවිල්ල (4) ලතැවිල්ළ

4. පහත සඳහන් පද දෙකෙහි **අදහස** පැහැදිලි ව ලියන්න.

(i) කටවහර ........................................................

(ii) බහුපා ........................................................

[ 3 වැනි පිටුව බලන්න.

5. අවුරුදු චාරිත්‍ර, මාෂටිය පැලැටි යන පද දෙකෙහි **'ත්‍ර'** **'ෂ'** යන අකුරු දෙකේ යෙදී ඇති **පිළිවෙළ** මොනවාදැ'යි වරහන තුළින් තෝරා **තිත් ඉර මත** ලියන්න.

(i) **'ත්‍ර'** - (රේඵය - රකාරාංශය - පාපිල්ල) : ..........................

(ii) **'ෂ'** - (ඉරුකාරය - දීර්ඝය - ගයනුකිත්ත) : ..........................

6. පින්තූර දෙස බලා ඒවාට ඉංග්‍රීසියෙන් කියන නම් ඉංග්‍රීසි අකුරෙන් ම ලියන්න.

(i)  ..........................

(ii)  ..........................

7. පහත සඳහන් වාක්‍යයෙහි අර්ථය ඉංග්‍රීසියට හරවා ඉංග්‍රීසියෙන් ලියන්න.

මම ආදරෙයි මගේ රටට ..........................

8. අර්ථය සිංහලෙන් ලියන්න.

(i) Who is shouting ? ..........................

(ii) Silence please ! ..........................

(iii) Let's sing a song. ..........................

9. (i) පහත සඳහන් වගන්තිය දෙමළෙන් කියන ආකාරය සිංහල අකුරින් ලියන්න.

සුබ උපන් දිනයක් වේවා ! ..........................

(ii) පහත සඳහන් දෙමළ වැකිවල අර්ථය සිංහලෙන් ලියන්න.

(අ) ඉදු එන්ගල් වනුප්පු. ..........................

(ආ) ආසිරියර් වැරුවාරා ? ..........................

- අංක 10 සිට 39 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු, දී ඇති පිළිතුරු අතුරෙන් තෝරා **යටින් ඉරක් අඳින්න.**

10. අවුරුද්ද පුරා ම මල් පිපෙන ශාකයකි,
(1) ඇහැළ. (2) එරබදු. (3) අරලිය. (4) රණවරා.

11. ජලජ ශාකයකි,
(1) මොනර කුඩුම්බිය. (2) ගිරිපිල්ල. (3) මිවන. (4) හයිඩ්‍රිල්ලා.

12. අඹ, ගම්මාලු, පොල් යන බීජ වර්ග ව්‍යාප්ත වන්නේ පිළිවෙළින්,
(1) සුළඟ, ජලය හා සතුන් මගිනි.
(2) සුළඟ, සතුන් හා ජලය මගිනි.
(3) ජලය, සුළඟ හා සතුන් මගිනි.
(4) සතුන්, සුළඟ හා ජලය මගිනි.

13. ශාක පත්‍ර උපයෝගී කර ගෙන තම නිවහන සාද ගන්නේ,
(1) කොකා ය. (2) කපුටා ය. (3) දිමියා ය. (4) ලේනා ය.

14. ශ්‍රී ලංකාවේ ඒකදේශික සත්ත්ව විශේෂයක් වන්නේ,
(1) කැහිබෙල්ලා ය. (2) මොනරා ය. (3) ගිරවා ය. (4) කපුටා ය.

[ 4 වැනි පිටුව බලන්න.

15. රූපයේ දැක්වෙන කුරුල්ලාගේ නම කුමක් ද?



(1) පිළිහුඩුවා
(2) කොට්ටෝරුවා
(3) කොරවක්කා
(4) ගිරවා

16. බතලවල ඇති බහුල ම පෝෂකය වන්නේ,
(1) ප්‍රෝටීන් ය. (2) පිෂ්ටය ය. (3) විටමින් ය. (4) ලිපිඩ ය

17. වැලි යට තැම්බීමෙන් කල් තබා ගත හැකි ආහාර වර්ග සඳහා නිදසුනකි.
(1) දෙහි, මාළු. (2) අඹ, අල. (3) රුනු, දෙල් (4) දෙහි, කො

18. අතු කැබලි සිටුවීමෙන් පැළ ලබා ගත හැකි බෝග වර්ගය කුමක් ද?
(1) මිරිස් (2) මෑ (3) කංකුං (4) අර්තාපල්

19. ගෙවතු වගාවේ දී භාවිත කෙරෙන උපකරණ පමණක් ඇති පිළිතුර තෝරන්න.
(1) උදැල්ල, මුල්ලුව හා ලණුය (2) මයිනහම, නගුල හා රේක්කය
(3) යතු කැටය, උදැල්ල හා මිටිය (4) උදැල්ල, මුල්ලුව හා රේක්කය

20. මෙම රූපික ප්‍රකාශනයෙන් අදහස් වන්නේ,



(1) 'වටරවුමක්' යන්නයි.
(2) 'ප්‍රතිචක්‍රීයකරණය කළ හැකිය' යන්නයි.
(3) 'දකුණට හැරවිය යුතුය' යන්නයි.
(4) 'පරෙස්සමෙන් පරිහරණය කරන්න' යන්නයි.


21. මහාමාරිය රෝගය බෝවන්නේ,
(1) මදුරුවාගෙනි. (2) මීයාගෙනි. (3) මැස්සාගෙනි. (4) කුකුළා

22. ඩෙංගු රෝගය සම්බන්ධයෙන් පහත දී ඇති ප්‍රකාශ අතුරෙන් **වැරදි** ප්‍රකාශය තෝරන්න.
(1) ඕනෑ ම මදුරුවකුගෙන් ඩෙංගු රෝගය බෝ විය හැකි ය.
(2) ඩෙංගු රෝගය ව්‍යාප්ත වීම වළක්වා ගත හැකි ය.
(3) ඩෙංගු රෝගය සුව කළ හැකි ය.
(4) ඩෙංගු රෝගය හේතු කොටගෙන මරණයට ද පත්විය හැකි ය.

23. අපිරිසිදු ජලය පානය කිරීමෙන් වැළඳිය හැකි රෝගයක් වන්නේ,
(1) මැලේරියාව ය. (2) ක්ෂය රෝගය ය. (3) මී උණ ය. (4) කො

24. පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් ජලය හා සම්බන්ධ **වැරදි** ප්‍රකාශය තෝරන්න.
(1) ජලයට නිශ්චිත හැඩයක් නොමැත.
(2) රත් කරන විට, ජලය ජල වාෂ්ප බවට පත් වේ.
(3) උෂ්ණත්වය වැඩි වන විට, සීනි ජලයේ දියවීම අපහසු වේ.
(4) කැලතීම නිසා, සීනි ජලයේ දියවීම පහසු වේ.

[ 5 වැනි පිටුව බලන්න

25. 

රූපයේ දැක්වෙන තරු රටාව හැඳින්වෙන නම කුමක් ද?
(1) හත්දින්නත් තරු
(2) මහ වලහා
(3) දඩයක්කාරයා
(4) ගෝනුස්සා

26. සිතියමක දුම්රිය මාර්ග දැක්වෙන සම්මත වර්ණය වන්නේ
(1) කහ ය. (2) නිල් ය. (3) කළු ය. (4) දුඹුරු ය.

27. නැති වූ හැඳුනුම් පත පිළිබඳ ව වාර්තා කිරීම, බයිසිකලය සඳහා බලපත්‍රයක් ලබා ගැනීම හා ඡන්ද හිමි නාම ලේඛනයේ පිටපතක් ලබා ගැනීම යන කාර්ය සඳහා යා යුතු ස්ථාන පිළිවෙළින්
(1) ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, පොලීසිය හා දිස්ත්‍රික් මැතිවරණ කොමසාරිස් කාර්යාලයයි.
(2) පොලීසිය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හා දිස්ත්‍රික් මැතිවරණ කොමසාරිස් කාර්යාලයයි.
(3) දිස්ත්‍රික් මැතිවරණ කොමසාරිස් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හා පොලීසියයි.
(4) පොලීසිය, දිස්ත්‍රික් මැතිවරණ කොමසාරිස් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයයි.

28. ශ්‍රී ලංකා ජාතික කොඩියෙහි, දමිළ ජන වර්ගය නියෝජනය වන්නේ,
(1) තැඹිලි පාට තීරුවෙනි. (2) රතු පාට තීරුවෙනි.
(3) කොළ පාට තීරුවෙනි. (4) කහ පාට තීරුවෙනි.

29. ශ්‍රී ලංකා රාජ්‍ය ලාංඡනයේ ඇති පුන්කලසෙන් අදහස් කෙරෙන්නේ,
(1) සෞභාග්‍යයයි. (2) ස්වයංපෝෂිත බවයි.
(3) විනය ගරුක බවයි. (4) සදාකාලික පැවැත්මයි.

30. කලාවැව ඉදි කරවන ලද්දේ,
(1) පණ්ඩුකාභය රජතුමා විසිනි. (2) ධාතුසේන රජතුමා විසිනි.
(3) මහසෙන් රජතුමා විසිනි. (4) මහා පරාක්‍රමබාහු රජතුමා විසිනි.

31. 

රූපයෙහි දැක්වෙන්නේ,
(1) යාපහුව බලකොටුවයි.
(2) ශ්‍රීපාදස්ථානයයි.
(3) සීගිරියයි.
(4) දළදා මාලිගාවයි.

32. කිණිහිර භාවිත කරනු ලබන්නේ
(1) වඩු මඩුවේ ය. (2) කම්මලේ ය.
(3) කුඹුරේ ය. (4) පතලේ ය.

33. යකඩ ඇණය වෙන අල්පෙනෙති වැඩියෙන් ම ඇදී එන්නේ පහත සඳහන් කුමන ඇටවුමේ ද?



(1) (2) (3) (4)

[ 6 වැනි පිටුව බලන්න.

34. පහත දැක්වෙන උපකරණ අතුරෙන්, බීම බෝතල් විවෘත කිරීමට යොදා ගැනෙන්නේ කුමක් ද?



(1)


(2)


(3)



(4)

35. බල්බය දැල්වීම සඳහා A හා B අග්‍ර දෙක සම්බන්ධ කිරීමට යොදා ගත හැක්කේ,




(1) වාර්නිෂ් කොළයකි.
(2) රියම් කොළයකි.
(3) ඩිමයි කොළයකි.
(4) සවි කොළයකි.


36. රූපයේ දැක්වෙන පරිදි, දැල්වෙන ඉටිපන්දම් හතරක්, එකිනෙකට වෙනස් උසින් යුත් වීදුරු භා
හතරකින් එක්වර ම වැසූ විට,




පළමුවෙන් ම නිවී යන්නේ කුමන ඉටිපන්දම ද?

(1) A (2) B (3) C (4) D

37. සර්පයකු දෂ්ට කළ විහාම ලබාදෙන ප්‍රථමාධාරයක් වන්නේ කුමක් ද?
(1) පිරිසිදු වාතාශ්‍රය ලැබෙන්නට සැලැස්වීම
(2) තද ඇඳුම් බුරුල් කිරීම
(3) දෂ්ට කළ ස්ථානය සබන් ගා ඇල්වතුරෙන් සේදීම
(4) රෝගියාගේ දෙපා අඩියක් පමණ එසවෙන සේ දිගා කරවීම

38. 

රූපයේ දැක්වෙන මැහුම් ක්‍රමය කුමක් ද?
(1) බ්ලැන්කට් මැස්ම
(2) මාළුකටු මැස්ම
(3) නැටි මැස්ම
(4) දම්වැල් මැස්ම

39. එල්ලේ ක්‍රීඩාවේ දී එක් කණ්ඩායමකට උපරිම වශයෙන් සිටිය යුතු ක්‍රීඩකයන් සංඛ්‍යාව කීය ද
(1) 10 (2) 12 (3) 14 (4) 16

40. සංඛ්‍යා රටාවේ ඊළඟ පද දෙක හිස්තැන් මත පිළිවෙළින් ලියන්න.
4050, 4060, 4070, 4080, ............... ........

41. කුඩා ම සංඛ්‍යාව තෝරා හිස්තැනෙහි ලියන්න.
$\frac{9}{10}$, $\frac{3}{4}$, 0.7, 0.9, ..........

42. පන්ති කාමරයක පුටු 2 බැගින් ඇති පේළි 12 ක් ද පුටු 3 බැගින් ඇති පේළි 6 ක් ද ඇ
එම පේළිවල ඇති පුටු සංඛ්‍යාව කීය ද?
..........

[ 7 වැනි පිටුව බලන්න

43. වර්ෂ 2010 දී 50 වන උපන් දිනය සැමරූ පෙරේරා මහතා සිය 30 වන උපන් දිනය සමරන ලද්දේ කුමන වර්ෂයේ දී ද? ..................

44. නිවැරදි ව හිස්තැන් පුරවන්න.


| මුදල් නෝට්ටු වර්ගය | මුදල් නෝට්ටු ගණන | මුදල |
|---|---|---|
| රුපියල් 50 | 1 | රුපියල් 50 |
| රුපියල් 20 | ...... | රුපියල් ......... |
| රුපියල් 10 | ...... | රුපියල් ......... |
| එකතුව | 6 | රුපියල් 130 |

45. ටොෆි 600 කින් 60 ක් ඉතිරි කර, අනෙක් සියල්ල ම, එක් පැකට්ටුවක 5 බැගින් වන සේ කුඩා පැකට්ටුවල අසුරන ලදි.

(i) කුඩා පැකට්ටුවල අසුරන ලද මුළු ටොෆි ගණන කීය ද? ..................

(ii) එවැනි කුඩා ටොෆි පැකට් කීයක් සැකසිය හැකි ද? ..................

46. රූපයේ දැක්වෙන තොරතුරු අනුව හිස්තැන් පුරවන්න.




1 kg 750 g     3 kg 250 g     ......kg ......... g


47. ධාරිතාව 1500 ml වන භාජනයක ජලය 900 ml ක් තිබේ. එම භාජනයට තවත් ජලය 900 ml ක් පිරුවෙන් වත් කළ විට, භාජනයෙන් පිටතට උතුරා යන ජල පරිමාව කොපමණ ද? .............. m

48. පස්වරු 2.45 ට නිවසින් පිටත් වූ මිහිරි, මිනිත්තු 45 ක දී පුස්තකාලයට ගියා ය. ඇය තව මිනිත්තු 40 ක් එහි සිටියා ය.

(i) මිහිරි පුස්තකාලයෙන් පිටත් වූයේ කීයට ද? පස්වරු ..................

(ii) එම වේලාව පැය 24 ඔරලෝසුව අනුව ලියන්න. පැය ......... : .........

49. ඉඩමකින් $\frac{1}{2}$ ක එළවලු ද $\frac{1}{4}$ ක මල් ද වගා කර ඇත. එසේ වගා කර ඇති බිම් ප්‍රමාණය මුළු ඉඩමෙන් කොපමණ කොටසක් ද? ..................


50. 

රූපයේ අඳුරු කර ඇති කොටසේ වර්ගඵලය මුළු රූපයේ වර්ගඵලයේ භාගයක් ලෙස දක්වන්න. ..................

51. 100 cm දිග මිනුම් පටියක මැදින් 15 cm ක් දිග කොටසකට හානි සිදුවිය. එම කොටස ඉවත් කර, ඉතිරි කැබලි දෙකේ 5 cm බැගින් එක මත එක තබා අලවන ලදි. දැන් මිනුම් පටියේ දිග කොපමණ ද? .................. cm


[ 8 වැනි පිටුව බලන්න

52. දී ඇති තොරතුරු අනුව වගුවෙහි හිස්තැන පුරවන්න.




| සිට | තෙක් | දු |
|---|---|---|
| කොළඹ | හලාවත | 7 |
| කොළඹ | පුත්තලම | 14 |
| පුත්තලම | අනුරාධපුරය | 7 |
| හලාවත | අනුරාධපුරය | ........ |

53. රූපයේ දැක්වෙන A, B හා C නමැති සමාන සෘජුකෝණාස්‍ර කඩදාසි ඇත. A මත B ද, B
වන සේ අලවා, D හැඩය ලබාගෙන ඇත.




(i) D හි පරිමිතිය කොපමණ ද? සෙන්ටිමීටර ..........

(ii) D හි වර්ගඵලය කොපමණ ද? වර්ග සෙන්ටිමීටර ..........

54. අපේ පාසලේ නිවාසාන්තර ක්‍රීඩා උත්සවය නිම විය. පළමුවන ස්ථානය දිනාග
නිවාසයේ නම කියවෙන තුරු අපි සියල්ලෝ ම නො ඉවසිල්ලෙන් බලා සිටියෙමු.

ශබ්ද විකාශන යන්ත්‍රයෙන්, **"සමනලපුර විද්‍යාලයේ නිවාසාන්තර තරගයෙන් පළමුව
ස්ථානය දිනා ඇත්තේ, නෙළුම් නිවාසය"**යි කියැවිණි.

ඔබ ද පළමුවන ස්ථානය දිනාගත් ජයග්‍රාහී නෙළුම් නිවාසයේ, ශිෂ්‍යයෙකු/ශිෂ්‍යාවක
ඒ මොහොත සිහිකරමින් නිර්මාණාත්මක වාක්‍ය **හයක්** ලියන්න. (එක් එක් වාක්‍යය
වචන **පහක්වත්** ඇතුළත් විය යුතු ය. උක්ත ආඛ්‍යාත සම්බන්ධය නිවැරදි විය යුතු

(i) ..........................................................................................

..........................................................................................

(ii) ..........................................................................................

..........................................................................................

(iii) ..........................................................................................

..........................................................................................

(iv) ..........................................................................................

..........................................................................................

(v) ..........................................................................................

..........................................................................................

(vi) ..........................................................................................

..........................................................................................

❋ ❋ ❋